# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல — 011-
Fax

දුරකථන
தொலைபேசி — 011-2887973 (HUNTING)
Telephone

වෙබ්.ලිපිනය
இணையதளம் — www.Police.lk
Web Site

ඊ මේල්
மின்னஞ்சல் — dir.media@police.gov.lk
E-mail


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1845 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 13/12/2024<br>පැය 2000 |

## මාධ්‍ය නිවේදනය

**මුහුරුගම්පොල අම්ඹරුක්ඛාරාම විහාරස්ථානයේ වාර්ෂික සංඝමිත්තා පෙරහැර හේතුවෙන් මාර්ගයේ රථවාහන ගමනා ගමනය සීමා කිරීම - මීරිගම පොලිස් වසම.**

මීරිගම පොලිස් වසමේ මුහුරුගම්පොල අම්ඹරුක්ඛාරාම විහාරස්ථානයේ වාර්ෂික සංඝමිත්තා පෙරහැර 2024.12.14 වන දින රාත්‍රී 08.00 සිට 2024.12.15 වන දින අළුයම් කාලය දක්වා වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

මීරිගම දිවුලපිටිය මාර්ගයේ මුහුරුගම්පොල අම්ඹරුක්ඛාරාම විහාරස්ථානයෙන් ආරම්භ කරනු ලබන පෙරහර මීරිගම පස්යාල මාර්ගය ඔස්සේ ඩී.එස්. හන්දිය දක්වා ගමන් කිරීමට නියමිතය.

මෙම පෙරහර ගමන් ගන්නා කාලය තුල පස්යාල ගිරිඋල්ල මාර්ගයේ මීරිගම නගරයේ බෝගස් හන්දියේ සිට ඩී.එස්.හන්දිය දක්වා වූ කොටසේ රථවාහන ගමනාගමනය සීමා කිරීම හේතුවෙන් රථවාහන තදබදයක් ඇතිවිය හැකි බැවින් පහත විකල්ප මාර්ග භාවිතා කරන මෙන් පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**විකල්ප මාර්ග -**

- පස්යාල හන්දියෙන් මීරිගම දෙසට ගමන් කරන වාහන මීරිගම දෙසට ගමන් නොකර නුවර කොළඹ ප්‍රධාන මාර්ගයේ ඉදිරියට ගමන් කර දංඕවිට හන්දියෙන් මීරිගම දෙසට ඇති මාර්ගය ඔස්සේ අධිවේගී මාර්ගයට හා ගිරිඋල්ල දෙසට ගමන් කල හැක.

- දිවුලපිටිය දෙස සිට මීරිගම අධිවේගී මාර්ගය භාවිතා කරන රියදුරන් මීරිගම දිවුලපිටිය මාර්ග භාවිතා නොකර කොටදෙනියාව සහ නාල්ල හද්දමුල්ල හන්දියෙන් දකුණට හැරී මීරිගම අධිවේගී මාර්ගයට ගමන් කල හැක.

- මීරිගම අධිවේගී මාර්ගයෙන් පැමිණෙන රථවාහන මීරිගම නගරය දෙසට ගමන් නොකර ගිරිඋල්ල දෙසට ගමන් කර හද්දමුල්ල හන්දියෙන් වමට හැරී නාල්ල කොටදෙනියාව මාර්ගය ඔස්සේ දිවුලපිටිය දෙසටත් කණ්ඩලම හන්දියෙන්

දකුණට හැරී අඹේපුස්ස දුම්රියපොළ මාර්ගය ඔස්සේ නුවර පාර දෙසටද ගමන් කල හැකිය.

මාර්ගයේ ගමන් ගන්නා රියදුරන්ට හා මහජනතාවට සිදු වන අපහසුතාවය අවම කර ගැනීම සඳහා මේ සම්බන්ධව ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**